**ශීර්ෂය 298 - මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 298 - මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව 2016 ඔක්තෝබර් 19 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 316.44 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 315.36 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1.08 ක් හෙවත් සියයට 0.34 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 95.94 | 95.00 | 0.94 | 0.98 |
| මූලධන | 220.50 | 220.36 | 0.14 | 0.06 |
| **එකතුව** | **316.44** | **315.36** | **1.08** | **0.34** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 29801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 7.97 | 2.65 | 3.50 | 4.46 | 30.00 | 16.62 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වන අංක 6000/0000/00/0006/0069/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 45.02 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාළ රෙගුලාසිය** |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර්19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

| | | |
|---|---|---|
| (ආ) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (ඈ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (ඉ) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය |

**3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

විෂය අංක 29801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,316,281 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.3.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කර භාණ්ඩ හා සේවා ලබා ගැනීමට වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් රු.මිලියන 316.2 ක ප්‍රතිපාදනද, පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් රු.මිලියන 0.2 ක ප්‍රතිපාදනද සලසා තිබුණි. එම ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**3.3.2 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**3.3.3 විගණන හා කළමනාකරණ කමිටුව**

2015 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පවත්වා නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව 2016 ඔක්තෝබර් 17 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3.5 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම් |
|---|---|---|
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| (i) 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනත | | |
| • 35 (2) වගන්තිය | 133,996,977 | 2013, 2014 හා 2015 වර්ෂවල අරමුදලේ ආදායමෙන් රාජ්‍ය ආදායමට බැර කළ යුතු පිළිවෙලින් රු.මිලියන 8.83 ක් රු.මිලියන 54.28 ක් හා රු.මිලියන 70.88 ක් වශයෙන් එකතුව රු.මිලියන 134.00 ක් වූ 1/3 ක කොටස රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි. එම ආදායම විධිමත් අනුමැතියකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් යොදා ගෙන තිබුණි. |
| • 20(1)(අ) හා 37 වගන්ති | - | වෙළඳාමේදී භාවිතා වන සියළුම මිනුම් උපකරණ වාර්ෂිකව සත්‍යාපනය කළ යුතු වුවද, එසේ සෑම උපකරණයක්ම සත්‍යාපනය කරන බව තහවුරු කර ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් අරමුදලේ ස්ථාපිත කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) 2006 අංක 12 දරන මුද්දර බදු පනත හා 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය | - | රු.25,000 කට වැඩි මුදල් ගෙවීම්වලදී රු.25 ක මුද්දර බද්දක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 1646 | - | 2015 වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුව සතු සංචිත වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 1997 පෙබරවාරි 03 දිනැති අංක 06/97 දරන චක්‍රලේඛය | - | 2009 මැයි 05 දින හිටපු අධ්‍යක්ෂවරයා විශ්‍රාම යාමෙන් පසු එදින සිට 2016 අගෝස්තු 31 දින වන විටත්, එම පුරප්පාඩුව නොපියවා වැඩබලන පදනම මත නිලධාරියෙකු පත්කර රාජකාරී කටයුතු ආවරණය කර තිබුණි. |
| **(ඈ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන චක්‍රලේඛයේ 2.1(අ) ඡේදය | - | අරමුදලේ අයවැය ලේඛනය 2014 සැප්තැම්බර් 30 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හා මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

භාණ්ඩාගාර බිල්පත් කල්පිරීමට ප්‍රථමයෙන් 2015 වර්ෂයේදී වට්ටම් කර මුදල් ලබා ගැනීම හේතුවෙන් අරමුදලට අහිමි වූ පොලීය රු.5,223,010 ක් වී තිබුණි.

**3.7** **මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-----------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 11 | 5 |
| (ii) | තෘතියීක මට්ටම | 30 | 1 | 29 |
| (iii) | ද්විතීයක මට්ටම | 198 | 133 | 65 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 97 | 70 | 27 |
| | **එකතුව** | **341** | **215** | **126** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ද්විතීයක මට්ටමේ තනතුරු යටතේ ගැනෙන එම්.එස්.ඩී. පරීක්ෂක පුහුණු තනතුර හා පරීක්ෂණාගාර සහායක පුහුණු තනතුරු සඳහා පිළිවෙලින් සේවකයන් 20 ක් හා 03 ක් බඳවා ගෙන තිබුණි. එම තනතුරු 23 සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.